# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 40 දරන දුම්කොළ බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ඔක්තෝබර් මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 ඔක්තෝබර් මස 12 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 40 දරන
දුම්කොළ බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ඔක්තෝබර් මස 03 වන දින]

එල්. ඩී.—ඕ. 20/72

දුම්කොළ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 40 දරන දුම්කොළ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන දුම්කොළ බදු පනත, එකී ප්‍රඥප්තියේ දීර්ඝ නාමය වෙනුවට පහත සඳහන් අලුත් දීර්ඝ නාමය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 245 වන අධිකාරයේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කිරීම.

> "සිගරැට් හෝ පයිප්ප දුම්කොළ නිෂ්පාදනය කිරීමේ දී උප යෝගී කර ගැනීමට අදහස් කෙරෙන ශ්‍රී ලංකා දුම්කොළ වෙනුවෙන් බද්දක් නියම කිරීම සඳහා සහ දිවයිනෙන් අප නයනය කරනු ලබන එකී සිගරැට් සහ පයිප්ප දුම්කොළ නිෂ්පාදකයන්ට එකී බදු ආපසු ගෙවීම සඳහා වූ පනතකි.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම ප්‍රඥප්තියේ 3අ වන සහ 3ආ වන වගන්ති වශයෙන් ඒවා බල පැවැත්විය යුතු ය :— 3අ වන සහ 3ආ වන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"සිගරැට් හෝ පයිප්ප දුම්කොළ අපනයනය කරන අවස්ථාවලදී දුම්කොළ බද්ද ආපසු ගෙවීම.

3අ. ශ්‍රී ලංකා දුම්කොළ පාවිච්චි කොට නිෂ්පාදනය කරනු ලැබූ යම් සිගරැට් හෝ පයිප්ප දුම්කොළ ප්‍රමාණයක් යම් නිෂ්පාදකයකු විසින් ලංකාවෙන් අපනයනය කරනු ලබන අවස්ථාවක දී, එකී සිගරැට් හෝ පයිප්ප දුම්කොළ නිෂ්පාදනය කරනු ලැබීමේ දී පාවිච්චි කරනු ලැබූ ශ්‍රී ලංකා දුම්කොළ ප්‍රමාණය වෙනුවෙන් ඔහු විසින් ගෙවනු ලැබූ දුම්කොළ බද්ද ආපසු ගෙවන ලෙස ඉල්ලීමක් කරනු ලැබූ විට, එම බදු මුදල ආපසු ගෙවනු ලැබීමට එවැනි නිෂ්පාදකයකු හිමිකම් ලැබිය යුතු අතර, එසේ ආපසු ගෙවනු ලබන බදු මුදල ඒකාබද්ධ අරමුදල කෙරෙහි වැය බරක් විය යුතු ය.

ඒ 00878—9567 (73/10)

ආපසු ගෙවන ලෙස ඉල්ලීම.

3ආ. 3අ වන වගන්තිය යටතේ දුම්කොළ බද්ද ආපසු ගෙවන ලෙස කරනු ලබන සෑම ඉල්ලීමක් ම—

(අ) ඒ කාර්යය සඳහා සුරා බදු කොමසාරිස් විසින් සපයනු ලැබිය හැකි ආකෘතිය කින් සුරා බදු කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු ය;

(ආ) ආකෘතියේ දැක්විය යුතු යයි සුරා බදු කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන සියලු තොරතුරු සෑම ඉල්ලීමක ම ඇතුලත් විය යුතු ය; තවද

(ඇ) එය සනාථ කිරීම පිණිස, අදාළ අපනයන ලේඛන සමග ඉදිරිපත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" දිසාපතිවරයාට බද්ද ගෙවිය යුතු බව.

5. යම් නිෂ්පාදකයකු විසින් මේ පනත යටතේ කලින් කල ගෙවිය යුතු වන දුම්කොළ බදු මුදල එම නිෂ්පාදකයා ස්වකීය ව්‍යාපාරය පවත්වාගෙන යන කර්මාන්ත ශාලාව පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයාට ගෙවිය යුතු අතර, එම බදු මුදල ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

දුම්කොළ බද්ද ගෙවිය යුතු ආකාරය සඳහා සහ 3අ වන වගන්තිය යටතේ ආපසු ගෙවීම කළ යුතු ආකාරය සහ ක්‍රියා පරිපාටිය සඳහා 10 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝග මගින් විධිවිධාන සැලැස්විය හැකි ය.".